**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022-12-21 |

පැමිණිලි පාර්ශවය : පී.ජී.එම්.විජේරත්න බණ්ඩා මයා
අංක 478/02, පත්තිනි පෙදෙසගම,
02 ඇල, පොළොන්රුව.

වගඋත්තරකාර පාර්ශවය :

01. පොලිස් පරීක්ෂක -ජේ.පී.ආර්.කේ. ජාගොඩගේ මයා,
මූලස්ථාන පොලීසිය,
යාපනය(වර්ථමාන සේවා ස්ථානය)

02. පොලිස් සැරයන් 50449 - ඩී.එම්.පී.දිසානායක මයා,
මූලස්ථාන පොලීසිය,
පොළොන්නරුව.

03. පොලිස් කොස්තාපල් 89563 - එම්.ඒ.කේ.ජයකැලුම් මයා,
මූලස්ථාන පොලීසිය,
පොළොන්නරුව.

04. පොලිස් කොස්තාපල් - බී.එම්.පී.සී.රාජරත්න මයා,
මූලස්ථාන පොලීසිය,
පොළොන්නරුව.

05. සිවිල් ආරක්ෂක භට 80801 ගයාන් මයා,
මූලස්ථාන පොලිස් ස්ථානය,
පොළොන්නරුව.

06. පොලිස් කොස්තාපල් 50532 ආර්.ජී.අශෝක මයා,
(සේවයේ නැත)

**පැමිණිලි අංකය : HRC/AP/559/2016**


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R.A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541/ 74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrcsl@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 -11-2505580 / 81 / 82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම පුතා වන දිනුක මධුෂාන් විජේරත්න යන අය පේරාදෙණිය ශික්ෂණ රෝහලේ සෞඛ්‍ය කාර්ය සහයකයෙකු ලෙස සේවය කරන බවත්, ඔහුගේ බිරිඳ ගර්භනී තත්ත්වයෙන් පසු වූ අතර, බිරිඳ දරු ප්‍රසූතියට දින නියමිත බැවින් නිවාඩු ලබා නිවසට පැමිණ සිටි බවත්, 2016.09.26 වන දින සිවිල් ඇඳුමින් සැරසුන පුද්ගලයින් කිහිප දෙනෙකු රාත්‍රී 12.00ට පමණ පැමිණ තම පවුලේ සියලුම දෙනා අවදි කර තම පුතාව එළියට ගෙන ගොස් මල් පැල ඇති පෝච්චියකට අත දමා පොලිතින් බෑග් එකක් ගෙන එහි ගංජා ඇති බව ප්‍රකාශ කරමින් පුතාව පොලීසියට රැගෙන ගොස් අසාධාරණයක් කළ බවය.

**අතෘප්තියට පත් අයගේ ප්‍රකාශය :-**

පැමිණිලිකරු පේරාදෙණිය ශික්ෂණ රෝහලේ සෞඛ්‍ය කාර්ය සහයකයෙකු ලෙස සේවය කරන බවත්, තම බිරිඳගේ පළමු දරු ප්‍රසූතියට දින නියමව තිබූ බැවින් රාජකාරි නිවාඩු ගෙන 2016.09.26 දින නිවසට පැමිණි බවත්, පසුදින බිරිඳව දරු ප්‍රසූතිය සඳහා පොළොන්නරුව රෝහලට ඇතුළත් කිරීම සඳහා නියමිතව තිබූ බවත්ය.

2016.09.26 වන දින රාත්‍රී නිවසේ සියලුම දෙනා නින්දට ගිය බවත්, රාත්‍රී 12.00ට පමණ නිවසේ දොර අරින ලෙසට පවසන හඬක් ඇසුන බවත්, ඒ අනුව තම පියා විසින් දොර අරින ලද අතර, තමාද පියා සිටි තැනට ගිය බවත්, එහිදී තම නම කියා ඔහු සිටිනවාදැයි විමසන ලද බවත්, එක් අයෙකු අඳුරේම මල් පෝච්චියට අත දමා 'මේ තියෙන්නේ බඩු' කියා ප්‍රකාශ කළ බවත් දක්වා ඇත. පසුව පැමිණිලිකරුව පොළොන්නරුව පොලීසිය වෙත රැගෙන ගිය අතර, පොලිස් සැරයන් දිසානායක නැමැති පොලිස් නිලධාරියා තමන්ට බැණ තර්ජනය කර පහර දුන් බවද දක්වා ඇත.

පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, තමන් නොකළ වරදකට අත්අඩංගුවට ගෙන මාස 06ක් බන්ධාගාරයේ රඳවා තැබීම හේතුවෙන් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවයි.

**වගඋත්තකරුවන්ගේ ප්‍රකාශය :-**

පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු දක්වමින් පොළොන්නරුව මූලස්ථාන පොලීසියේ ස්ථානාධිපතිවරයා 2016.11.04 දිනැති වාර්තාව මඟින් දන්වා ඇත්තේ, වගඋත්තකරුවන් රාත්‍රී ජංගම සංචාරයේ යෙදී සිටියදී ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකරන ලද බවත්, වැටලීම සිදු කිරීමේදී පැමිණිලිකරු සන්තකයේ තිබී නීතිවිරෝධී මත්ද්‍රව්‍ය සොයා ගත් බවත්ය. ඒ අනුව 2016.10.27 වන දින පැය .01.00ට පැමිණිලිකරු නීතිවිරෝධී සන්තකය දරමින් සිටියදී වරද කියා දී අත්අඩංගුවට ගත් බවද, අත්අඩංගුවට ගත් පැමිණිලිකරුව

2016.10.28 වන දින පැය 12.00ට ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරිම සඳහා රැගෙන ගිය බවද දක්වා ඇත.

**වැටලීමට සහභාගී වූ වගඋත්තකරුවන්ගේ ප්‍රකාශ :-**

මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වැටලීමට සහභාගී වූ වගඋත්තකරුවන් විසින් සඳහන් කර ඇත්තේ, තමන් සියලුම දෙනා සඳහා පොළොන්නරුව මූලස්ථාන පොලීසියේ අපරාධ අංශයේ රාජකාරි කටයුතු සිදු කරන නිලධාරින් වන බවට දක්වා ඇත.

2016.09.26 වන දින පොළොන්නරුව පත්තිනි දේවාලයේ උත්සවයක් පැවති අතර, 'පත්තිනි දේවාලය අසල මත් ද්‍රව්‍ය විකුණන අයෙකු සිටින බවට' පොළොන්නරුව විශේෂ කාර්යාංශයේ බුද්ධි නිලධාරියෙකුගෙන් තොරතුරක් ලද බවත්, ඒ අනුව ජංගම සංචාරය කරමින් තොරතුරේ සඳහන් දේවාලය අසලට පැමිණි බවත්, එවිට තොරතුර ලබා දුන් බුද්ධි නිලධාරියාද එම ස්ථානයේ සිටි බවත්ය. ඒ අනුව පැමිණිලිකරු පදිංචි නිවස පෙන්වා එම නිවසේ අයෙකු දේවාලයට පැමිණෙන අයට මත්ද්‍රව්‍ය විකුණන බවට වගඋත්තරකරුවන්ට දැන්වූ බවත්, එවිට වේලාව රාත්‍රී 12.00ට පමණ වූ බවත් දක්වා ඇත.

බුද්ධි නිලධාරියාගේ තොරතුරු අනුව අදාළ නිවස අසල රැඳී සිටිමින් අදාළ නිවසේ හා දේවාලයේ සිදුවන දෙය නිරීක්ෂණය කළ බවත්, මෙම නිරීක්ෂණයේදී, අදාළ නිවස ඉදිරිපිට පාරට පුද්ගලයෙකු පැමිණි අතර, එවිට නිවසේ ඉදිරිපිට ආලෝක පහන් නිවා දමන ලද බවත්, නිවසේ පසුපස විදුලි පහන් දල්වන ලද බවත්, පසුව අදාළ නිවසේ සිට පැමිණි පුද්ගලයෙකු හා අනෙක් පුද්ගලයා කතා බහක යෙදුනු බවත්, පසුව යතුරු පැදිය පිටව ගිය බවත් පෙනී ගිය බවයි. පසුව වැටලීමට සහභාගී වූ නිලධාරීන් කණ්ඩායම එකතු වී එම ස්ථානයේ සිටි තැනැත්තා අල්ලා ගැනීමට කටයුතු කළ බවත්, අල්ලා ගැනීමෙන් පසුව ඔහුව පරීක්ෂා කිරීමේදී ඔහු ඇඳ සිටි සරමේ සඟවා ගෙන තිබූ පාර්සලයක් හමු වූ බවත්, එම පාර්සලයේ නීතිවිරෝධී මත්ද්‍රව්‍ය හා ගංජා තිබූ බවත්, ඒ අනුව වරද කියා දී අත්අඩංගුවට ගත් බවත් දක්වා ඇත. අත්අඩංගුවට ගත් තැනැත්තා දිනුක මධුශාන් විජේරත්න බවට හඳුනා ගත් අතර, පසුව ඔහුව පොළොන්නරුව පොලීසිය වෙත භාර දී ඇති බවත්, අත්අඩංගුවට ගැනීමේදී නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීමක් සිදුව නොමැති බවත් දක්වා ඇත.

**නිරීක්ෂණය :-**

අභියාචකයට පත් තැනැත්තා ප්‍රධාන කොටම ප්‍රකාශ කර ඇත්තේ, තමා නිවසේ නිදා සිටියදී පොලිස් නිලධාරීන් නිවසට පැමිණ නිවැසියන් අවදි කරවා නිවසේ දොර අරවා තමාව නිවස තුළදී කිසිම නීතිවිරෝධී සන්තකයක් නොදරමින් සිටියදී අත්අඩංගුවට ගෙන අසාධාරණයක් සිදුකළ බවය.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, ලද තොරතුරකට අනුව කරන ලද වැටලීමකදී නීතිවිරෝධී ගංජා හා හෙරොයින් පැමිණිලිකරු සන්තකයේ තිබී අත්අඩංගුවට ගත් බවත්, පැමිණිලිකරුගේ අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූල අත්අඩංගුවට ගැනීමක් වන බවත්ය.

පැමිණිලිකරු නීතිවිරෝධී ගංජා හා හෙරොයින් ළඟ තබා ගනිමින් සිටියදී අත්අඩංගුවට ගත් බව සනාථ කරන උධෘත හා ලේඛන වගඋත්තරකරුවන් විසින් කොමිසම වෙත ඉදිරිපත් කර ඇත.

අදාළ උධෘත පරීක්ෂා කර බැලීමේදී, වගඋත්තරකරුවන් විශේෂ ජංගම රාජකාරී සඳහා යොදවා සිටින ලද නිලධාරීන් කණ්ඩායමක් වන බවටත්, ඔවුන් ජංගම රාජකාරීවල නිරත වෙමින් සිටියදී විශේෂ කාර්යාංශයේ සේවය කරන බුද්ධි නිලධාරියෙකු විසින් ලබාදුන් තොරතුරකට අනුව එම බුද්ධි නිලධාරියාගේ ද සහය ඇතිව අදාළ වැටලීම සිදුකර ඇති බවටත් නිරීක්ෂණය වේ.

බුද්ධි නිලධාරියාගේ තොරතුරේ '2016.09.26 වන දින රාත්‍රී පරාක්‍රම සමුද්‍රයේ වැව් බැම්ම පිහිටා ඇති දේවාලයේ උත්සවයක් පැවති බවටත්, එම උත්සවයට පැමිණෙන අයට පරාක්‍රම සමුද්‍රයේ වැව් බැම්මේ පහළ නිවසක් අසල ඉදිරි මාර්ගයේ ගංජා හා හෙරොයින් විකුණන බවටත්' සඳහන්ව ඇත.

ඒ අනුව තොරතුරේ සඳහන් නිවසේ පිහිටි මිදුලේ සිට මාර්ගය දෙසට පුද්ගලයෙකු පැමිණ ඇති අතර, එහිදී නිලධාරීන් ඔහුව වටලා 2016.09.27 වන දින පැය 01.00ට නීතිවිරෝධී ගංජා හා හෙරොයින් ළග තබා ගෙන සිටියදී අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරුගේ හා අතෘප්තියට පත් අයගේ ප්‍රකාශ අනුව, දිනුක මධුශාන් විජේරත්න වන පැමිණිලිකරු ඔහුගේ බිරිද හා දෙමාපියන් සමග 2016.09.27 වන දින රාත්‍රී කාලයේ නිවසේ නිදා ගනිමින් සිටියදී වගඋත්තකරුවන්_ රාත්‍රී 12.00ට පමණ ඔහුගේ නිවසට පැමිණ ඔවුන්ට අවදි කරවා අත්අඩංගුවට ගෙන ඇති බවට දැක්වේ. එම කාරණය තහවුරු කිරීම සඳහා පැමිණිලිකරුගේ නිවසේ සිටි අයගේ සාක්ෂි දිවුරුම් ප්‍රකාශ මගින් ඉදිරිපත් කර ඇත.

දෙපාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල, උධෘත හා සාක්ෂි සලකා බැලීමේදී පැමිණිලිකරු මහනුවර ප්‍රදේශයේ රජයේ රෝහලක සේවය කරන අයෙකු බවටත්, ඔහුගේ බිරිඳ දරු ප්‍රසූතිය සිදුවීමට දින නියමිතව තිබූ බැවින් ඔහු නිවසට පැමිණ ඇති බවටත්, ඉදිරිපත්ව ඇති සාක්ෂි අනුව නිරීක්ෂණය වේ .

පැමිණිලිකරුව අත්අඩංගුවට ගන්නා අවසථාවේදි පැමිණිලිකරුගේ නිවසේ සිටි මව,පියා, බිරිඳ හා ඥාති සහෝදරියක විසින් ලබා දී ඇති සාක්ෂි අනුව පැමිණිලිකරු නිවසේ නිදා සිටියදී අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය කළ හැකිය.

වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති උධෘත සලකා බැලීමේදී, බුද්ධි නිලධාරියෙකු විසින් ලබා දුන් තොරතුරකට අනුව බුද්ධි නිලධාරියාගේ සහය ඇතිව පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ බවත්, වගඋත්තකරුවන් තොරතුරේ සඳහන් ස්ථානය වෙත යන විට තොරතුරේ සඳහන් මිදූලේ සිට මාර්ගය දෙසට පුද්ගලයෙකු එමින් සිටියදී වැටලීම සිදුකර අත්අඩංගුවට ගෙන ඇති බව සඳහන් වේ.

වගඋත්තකරුවන් පවසන පරිදි පැමිණිලිකරුගේ ස්ථානයේදී නීතිවිරෝධී සන්තකයක් දරමින් සිටියදී අත්අඩංගුවට පත් තැනැත්තා පොලීසිය වෙත රැගෙන යාම පිළිබඳව පැමිණිලිකරුගේ භාරකරුවන්ට දැන්වීමට අවස්ථාවක් පැවති බවට ඔවුන්ගේ උධෘත මඟින් නිරීක්ෂණය වන්නේ නැත.

පැමිණිලිකරුගේ සාක්ෂි එකම පවුලේ සාක්ෂි වුවද, එම සාක්ෂි විමසා බැලීමේදී පැමිණිලිකරුව ඔහුගේ නිවස තුළදී කිසිදු නීතිවිරෝධී සන්තකයක් ඔහු නොදරමින් සිට ඇති අවස්ථාවක අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වී ඇත.

පැමිණිලිකරුට එරෙහිව පොළොන්නරුව ම/උ අංක B 1636/2016 යටතේ ගරු අධිකරණය වෙත කරුණු වාර්ථා කර ඇති අතර, අංක 23057 යටතේ චෝදනා ගොනු කර තිබේ. පැමිණිලිකරුට එරෙහිව ඇති චෝදනා සම්බන්ධයෙන් ගරු අධිකරණයේ විභාග වූ නඩුවේ තීන්දුව 2020.11.04 වන දින ලබාදී ඇති අතර, එම තීන්දුව ප්‍රකාරව "වගඋත්තකරුවන් විසින් පැමිණිලිකරුට එරෙහිව කර ඇති චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කර නොමැති බව පැහැදිලිවම සෑහීමකට පත් වෙමි"යනුවෙන් සඳහන් කර ගරු අධිකරණය විසින් පැමිණිලිකරුට අදාළ චෝදනාවන්ගෙන් නිදොස් කොට නිදහස් කර ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

ඒ අනුව ඉදිරිපත් කර ඇති සියළු කරුණු සලකා බැලීමේදී වගඋත්තකරුවන්ගේ ක්‍රියාවක් හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාවෙහි සඳහන් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාවෙහි සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, අදාළ වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීමට කටයුතු කළ යුතු බවට පොලිස්පති වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.01.23 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :

01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

03. මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුරය.

B/